(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 33]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 ඔක්තෝබර් මස 24 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0064/’08

1.

ගරු රවි කරුණානායක මහතා,—වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිහින් එයාර් සමාගම භාවිතා කරනු ලබන කාර්ය මණ්ඩලය රහිතව ලබා ගත් සහ කාර්ය මණ්ඩලය සහිතව ලබාගත් ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ගුවන් යානා තෝරා ගන්නා ලද්දේ ටෙන්ඩර් ක්‍රියාවලියක් මගින් ද;

(iii) එම තෝරා ගැනීම ටෙන්ඩර් පටිපාටියකට අනුව සිදුවූයේ නම් ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ සමාගම්වල නම් සහ ඒවා තෝරාගැනීමේ ක්‍රියාවලිය කවරේද;

(iv) එම ක්‍රියාවලිය තීරණය කළ පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාර්ය මණ්ඩලය රහිත සහ කාර්ය මණ්ඩලය සහිත බදු පදනම මත ලබා ගත් ගුවන් යානා සඳහා මාසිකව දරන පිරිවැය කවරේද;

(ii) මෙම තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි අයගේ නම් සහ විගණන නිලධාරීන් විසින් අනුමත කරන ලද අවසන් තෝරාගැනීම සඳහා වූ එම මණ්ඩලයේ නිර්දේශයන් කවරේද;

(iv) මෙම සමාගමෙහි සේවයෙහි යෙදී සිටින කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංඛ්‍යාව කවරේද;

(v) ඔවුන්ගේ වැටුප් පරිමාණයන් සහ එමගින් මාසිකව සමාගමට ඇතිවන බලපෑම කවරේද;

(vi) අද දක්වා මිහින් එයාර් සමාගමේ ගිණුම් කවරේද;

(vii) රජයෙන් මිහින් එයාර් සමාගමට මුදල් ලබාදුන් දිනය සහ ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(viii) එම මුදල් ලබාදෙනු ලැබූ වැය ශීර්ෂය සහ එම ගෙවීම පාර්ලිමේන්තුව මගින් අනුමත කළ දිනය කවරේද;

(ix) විසර්ජන පනත් හරහා 2006 හා 2007 යන වර්ෂවල මිහින් එයාර් සමාගමට අරමුදල් වෙන් කරන ලද වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මිහින් එයාර් සමාගමේ මූල්‍ය ගනුදෙනුවලට සහභාගිවූ මිහින් එයාර් සමාගමේ සහ භාණ්ඩාගාරයේ ප්‍රධාන නිලධාරීන්ගේ නම් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) මෙම මුදල් නීත්‍යානුකූලව වෙන් කර නොමැති බවත්, එම නිසා මෙම සියලුම නිලධාරීන් රාජ්‍ය මුදල් අයථා ලෙස පරිහරණය කිරීමේ චෝදනාවට භාජනය වන බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'08

2\.

ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ප්‍රවාහනය දියුණු කිරීමට ඉන්දියානු රජය ණය ක්‍රමයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ණය ක්‍රමය යටතේ ලබාදුන් මුදල් ප්‍රමාණය සහ එය ලබාදුන් දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්දියාවේ සීමාසහිත රයිට්ස් සමාගම විසින් දුම්රිය දෙපාර්තමේන්තුවට ඇමෙරිකානු ඩොලර් මිලියන 150ක ණය ක්‍රමයක් ලබා දී තිබේද;

(ii) එම ණය ක්‍රමයට අදාළ මුදල ලැබී තිබේද, එසේත් නැත්නම් එය ලබා දීමට ගිවිස ගෙන තිබේද;

(iii) එයට අදාළ දේශීය නියෝජිතයන්ගේ නම් කවරේද;

(iv) මෙම ණය ක්‍රමයට අදාළ මුදල ලබා ගැනීමට ගිවිස ගැනීම සඳහා වසර දෙකක් ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0096/'08

3\.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතිගරු ජනාධිපතිතුමා විසින් 2007 දෙසැම්බර් මස සිදුකළ ජපාන සංචාරයෙහි මුළු වියදම කොපමණද;

(ii) එම සංචාරයේදී කැටුව ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(iv) ඒ ප්‍රතිලාභ කවරේද හා ඒවායේ ප්‍රමාණය කොපමණද;

(v) මේ වනවිට ලැබී ඇති ප්‍රතිලාභවල ප්‍රමාණය කොපමණද;

(vi) ලැබීමට නියමිත ප්‍රතිලාභ ලැබෙන දිනය හා ලැබීමට නියමිත ප්‍රතිලාභ ප්‍රමාණය කවරේද;

(vii) මෙම ප්‍රතිලාභ අදාළ වන ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ප්‍රතිලාභ වෙනුවෙන් අපි ජපානයට ලබා දී ඇත්තේ කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0168/'08

4\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) නුගේගොඩ ඇඟලුම් වෙළෙඳ ආයතනයක් ඉදිරිපිට පුපුරන ලද බෝම්බයෙන් යූ. ඩී. මහිංසා ප්‍රදීපනී මෙනෙවිය මිය ගිය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 14/1, හිල්ක්‍රෙස්ට් වත්ත, නිවුන්ගම, පිළියන්දල පදිංචි ඇගේ දෙමාපියන් වෙත වන්දි ලෙස ලබා දී ඇත්තේ රුපියල් 25,000/- ක් බවත්;

(ii) බෝම්බයෙන් මියගිය අයගේ පවුල් සඳහා රුපියල් ලක්ෂයක වන්දි මුදලක් ලබාදෙන බවට ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කළ බවත්;

(iii) එසේ වුවද, වයස අවුරුදු 18ට අඩු මියගිය අය වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුදල රු. 25,000/- ට සීමාවීමෙන් සත්‍ය වන්දි ගෙවීම හා ප්‍රචාරය අතර වෙනසක් ඇති බවත්;

(iv) බෝම්බයෙන් දරුවා අහිමි වූ දෙමාපියන් එයින් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එකී දෙමාපියන් වෙනුවෙන්, ප්‍රචාරය කළ පරිදි වන්දි මුදලක් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0169/'08

5\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) මාර්ග අංක 255 කොට්ටාව - ගල්කිස්ස හා මාර්ග අංක 158 පිළියන්දල - මොරටුව මාර්ග පුළුල් කොට සංවර්ධනය සඳහා වැඩ ආරම්භ කළ බවත්;

(ii) වසර ගණනාවක සිට සංවර්ධන කටයුතු අතර මග නතර කර ඇති බවත්;

(iii) මෙම තත්ත්වය වාහන ගමනාගමනයට බාධාවක් හා අනතුරු සඳහා හේතුවක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එකී මාර්ග වල සංවර්ධන කටයුතු අතර මග නතර කරනු ලැබුවේ කවර දිනයකදී ද;

(ii) එසේ කිරීමට හේතු කවරේද;

(iii) මෙම මාර්ග නැවත සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0213/'08

6\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) සමාජ සේවා හා සමාජ සුභසාධන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0214/'08

7\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0215/'08

8.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අතිරේක වැවිලි භෝග සංවර්ධන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0487/'08

9.

ගරු විජිත රණවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) කැබිනට් අමාත්‍යවරු, කැබිනට් නොවන අමාත්‍යවරු සහ නියෝජ්‍ය අමාත්‍යවරු කොපමණ සංඛ්‍යාවක් සඳහා, කුලී පදනම මත නිවාස ලබා ගැනීමට, මාසිකව රුපියල් එක් ලක්ෂයක (රු. 100,000/-) දීමනාව ලබා දෙන්නේද;

(ii) එම දීමනාව ලබා දෙන අමාත්‍යවරුන්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු (කැබිනට් අමාත්‍ය, කැබිනට් නොවන අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය ලෙස) පිළිවෙළින් කවරේද;

(iii) ප්‍රථම වරට කුලී පදනම මත නිවාස ලබා ගැනීමේ පහසුකම අමාත්‍යවරුන්ට ලබා දුන්නේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004.06.01 වැනි දින සිට 2007.12.31 වැනි දින දක්වා අමාත්‍යවරුන්ට කුලී පදනම මත නිවාස ලබා ගැනීම සඳහා වැය කරනු ලැබූ මුළු මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0539/'08

10.

ගරු බිමල් රත්නායක මහතා,— ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලියාපදිංචි ගැණුම්කරුවන් පිරිසක් සිටින්නේද;

(ii) එම ලියාපදිංචි පිරිසට පරිබාහිරව වෙනත් අයට අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමට අවස්ථාවක් ලබාදී තිබේද;

(iii) 2007 වර්ෂයේදී ලියාපදිංචි ගැණුම්කරුවන්ට කොපමණ අබලි ද්‍රව්‍ය ප්‍රමාණයක් ලබා දී තිබේද;

(iv) 2007 වර්ෂයේදී ලියාපදිංචි ගැණුම්කරුවන් නොවූ ගැණුම්කරුවන් වෙත කොපමණ අබලි ද්‍රව්‍ය ප්‍රමාණයක් ලබා දී තිබේද;

(v) 2007 වර්ෂයේ දී විවිධ අබලි ද්‍රව්‍ය කි.ග්‍රෑ. 1000කට වඩා එකවර නිකුත් කළ අවස්ථා තිබේද;

(vi) එසේ නම්, ඒ කවුරුන් වෙතද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'08

11.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1466/5 දරන 2006.10.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වැනි වගන්තිය යටතේ වූ නියමය මත සනකමින් මයික්‍රොන් 20 හෝ ඊට අඩු පොලිතින් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, විකිණීම සහ භාවිතා කිරීම තහනම් කර ඇති බව එතුමා දන්නෙහි ද?

(ආ) එහෙත් තවමත් පරණ ක්‍රමයට පොලිතින් නිෂ්පාදනය කර වෙළෙඳපොළට නිකුත් කිරීමෙන් භාවිතා වන බව එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) ඉහත ගැසට් නිවේදනය අනුව නීති ක්‍රියාත්මක කිරීමට දැනට ගෙන ඇති හා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0650/'08

12.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ගොවි ජනතාව නගාසිටුවීමේ ව්‍යාපෘතියක් ලෙස පැවැත් වූ "ජාතික ගොවිජන පොළ" සහ ප්‍රදර්ශනයේ ස්වභාවය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ජාතික ගොවිජන පොළ හා ප්‍රදර්ශනය පැවැත් වූ ස්ථාන කවරේද;

(ii) එම එක් එක් ගොවිජන පොළ හා ප්‍රදර්ශන පැවැත්වීම සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එක් එක් ගොවිජන පොළ හා ප්‍රදර්ශනය මගින් ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පොළ හා ප්‍රදර්ශනයට සමගාමීව "ගොවිජන වාසනා" නමින් ලොතරැයි පතක් මුද්‍රණය කර අලෙවි කළේද;

(ii) එම ලොතරැයි අලෙවියෙන් ලද ආදායම කොපමණද;

(iii) එම ලොතරැයිය මගින් ලබාදෙන ත්‍යාගයන්හි වටිනාකම ජයග්‍රාහී ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ත්‍යාග භාණ්ඩ හෝ ත්‍යාග මුදල් අදාළ ජයග්‍රාහකයිනට ලබාදී තිබේද;

(v) නොඑසේ නම්, එම ත්‍යාග භාණ්ඩ හෝ ත්‍යාග මුදල් ලබාදීම සඳහා ගනුලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0680/'08

13.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව් වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන්වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේ නම්, ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාල සීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන්, සුළු වාරිමාර්ග හා මහා වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබාදීමට විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැතිනම් ඒවා ලබාදීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0681/'08

14.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ගවලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව් වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන්වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේනම්, ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාලසීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන්, සුළු වාරිමාර්ග හා මහ වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබාදීමට විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැතිනම් ඒවා ලබාදීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0682/'08

15.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## යෝජනා පිළිබඳ දැනුම් දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2008 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා, 08 වැනි සෙනසුරාදා, 10 වැනි සඳුදා, 11 වැනි අඟහරුවාදා, 13 වැනි බ්‍රහස්පතින්දා, 14 වැනි සිකුරාදා සහ 15 වැනි සෙනසුරාදා යන දිනයන් "විසර්ජන පනත් කෙටුම්පත (2009) " සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතුය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2009)" සලකා බැලීම සඳහා 2008 නොවැම්බර් මස 07 වැනි දින සිට 15 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. හා. 9.30 සිට අ.හා. 5.30 දක්වා විය යුතුය. අ.හා. 5.00 ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ජේද ක්‍රියාත්මක විය යුතුය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. හා. 9.30 සිට අ. හා. 2.00 දක්වා විය යුතු ය. මධ්‍යාහ්න 12.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

4.

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.
විසර්ජන පනත් කෙටුම්පත (2009) — දෙවැනි වර කියවීම.

*3.
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.
ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*5.
ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.
සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*8.
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.
ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.
අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*12.
ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*14.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*16.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*18.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා | |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා | |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000<br>රු. 550,000,000 | සිට<br>දක්වා | |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*19.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1) — ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 අප්‍රේල් මස 30 දිනැති අංක 1547/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2) — ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 අගෝස්තු මස 26 දිනැති අංක 1564/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නියෝග,— 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 29 වැනි වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු ඉහත කී පනතෙහි 6 වැනි වගන්තියේ (ආ) ඡේදය යටතේ ගනුදෙනුකරුවෙකුගේ ඉල්ලීම මත සිදු කරන විද්‍යුත් අරමුදල් මාරුවකදී මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු මුදල් ප්‍රමාණයේ අවම සීමාව නියම කරමින් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 ජුනි මස 25 දිනැති අංක 1555/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*22.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද “2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග” අනුමත කළ යුතුය.

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*24.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*25.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධුරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධුරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධුරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

33.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.